www.kidworship.kr

# යෝසෙප් 2

– 13rd Story–



89Page

**පොතේ ගුරා** ෆාරාවෝ, යෝසෙප් මිසරයේ අධිපතියා කොට පත් කළා. ඔහු ෆාරාවෝට පමණක් දෙවැනි ව සිටියා. යෝසෙප් මිසරයේ (ඊජිප්තුවේ) අධිපතියා වූ කල්හී වසර 7ක් පුරා රට සාරවත්ව, ධාන්‍ය බහුලව, කෑමබීම හිඟයක් නොමැතිව පැවතියා.

**යෝසෙප්** ඔබලා දැන් ධාන්‍ය රැස් කරන්න.


**පොතේ ගුරා** ඒ මිසරයේ හිටි මිනිසුන්ට යෝසෙප් මේ කියන දේවල් සම්පූර්ණයෙන්ම හරිහැටි තේරුණේ නෑ. නමුත් යෝසෙප් දුන්න මගපෙන්වීමේ ආකාරයටම ඔවුන් සියල්ලම සිදු කළා.

**පොතේ ගුරා** සරවත් අවුරුදු 7 ඉවරවීගෙන යත්ම සාගත කාලය ආරම්භ වුණා. කෙත්වතු වියළී ගියා. කෑම අගහිඟව යන්නට වුණා. නමුත් යෝසෙප් කී ආකාරයට සාරවත් වසර 7ක් පුරා රැස්කර තැබූ ධාන්‍ය හේතුවෙන් මිසර ජනතාවට දුකට පත්වීමට අවශ්‍ය වුණේ නෑ. යෝසෙප් දේශයේ රැස්කර තැබූ ධාන්‍යවලින් රට වැසියන්ව පෝෂණය කළා.

මිසරයේ ආහාර තිබෙන බව ඇසූ වෙනත් දේශවල ජනයා ආහාර ද්‍රව්‍යය ලබාගන්න පිණිස මිසරයට එන්නට වණා. කානාන් දේශයේ ජීවත්ව සිටි යාකොබ් සහ ඔහුගේ පවුලේ අයටත් මේ ආරංචිය ලැබුණා.

ඔවුනුත් ආහාර හිඟයෙන් පීඩා විඳිමින් සිටි නිසා යාකොබ් සිය දරුවන්ට කතා කොට මෙසේ කීවා.

.................................................................................



90Page

**යාකොබ්** මිසරයට (ඊජිප්තුවට) ගොස් අපිටත් ආහාර දේවල් රැගෙන එන්න.

**පොතේ ගුරා** යෝසෙප්ගේ සහෝදරයන් 10 දෙනෙක් ඊජිප්තුවට පිටත් වුණා. නමුත් බාල සහෝදරයා වූ බෙන්ජමින් පියා සමග නතර කර ගියා.

.................................................................................

**පොතේ ගුරා** යෝසෙප්ගේ සහෝදරයන් ඊජිප්තුවට පැමිණි කල ඊජිප්තුවේ අධිපතියා නැතහොත් අගමැතිවරයා ඉදිරියට ආවා. ඔවුන්ගෙන් කිසි කෙනෙක් මේ යෝසෙප් බව හඳුනාගත්තේ නෑ. නමුත් ක්ෂණයකින් යෝසෙප් තමාගේ සහෝදරයන්ව හඳුනාගත්තා. තමන් යොවුන්වියේදී දැකපු හීනයන් යෝසෙප්ට මතක් වුණා. යෝසෙප් තමන්ගේ සහෝදරයන් දැකීමෙන් ඉතාමත් ප්‍රීතියට පත් වුණ නමුත් ඔහු ගාම්භීර ලීලාවකින් රළු ස්වරයකින් ඔවුන්ව ඇමතුවා.



91Page

**යෝසෙප්** නුඹලා ඔත්තුකාරයෝ. අපේ දේශයේ ඇත්තාවූ දේවල් බලන්නට පැමිණි ඔත්තුකරයන් ...

**සහෝදරයෝ** නෑ නෑ මගේ ස්වාමිනී... ඔබේ දාසයන් කානාන් සිට මෙහි ආවේ ආහාරවලට යමක් ලබා ගැනීමටයි.

**යෝසෙප්** නුඹලාගේ කී දෙනෙක් ඉන්නවා ද?

සහෝදරයෝ අපි ඔක්කොම 12 දෙනෙක්. බාලයා ගෙදර නතර කරලයි ආවේ.
තවත් සහෝදරයෙක් හිටියා, නමුත් ඔහු දැන් ජීවතුන් අතර නැහැ.

පොතේ ගුරා මේ තොරතුරු ඇසූ යෝසෙප්ට බෙන්ජමින් බලන්නට ඕන වුණා.

යෝසෙප් ගිහින් බෙන්ජමින් එක්කන් එන්න. එතකොට තමයි මම ඔයාලව
විශ්වාස කරන්නේ. ඔයාලට දැන් කෑම අරන් යන්න පුලුවන්.
ඒත් ගිහින් කවුරුත් එහෙ ඉන්න බෑ. නැවතත් මෙහේ එන්න ඕන.
ඔයාලා ආවේ නැත්තන්, ඔයාලගේ එක මල්ලි කෙනෙක් ඔයාලට
නැති වෙයි තේරුණා ද?

.......................................................................................



92Page

පොතේ ගුරා සිමියොන්ව ඊජිප්තුවේ නතර කරලා අනික් සහෝදරයන් සියලු දෙනා
කෑමත් රැගෙන කානාන්වලට යන්න පිටත් වුණා. ඔවුන් ගිහින් බෙන්ජමින්ව
නැවත රැගෙන ඊජිප්ත දේශයට ආවා.
බෙන්ජමින් දුටු යෝසෙප් ගොඩක් වේදනාවට පත් වුණා.
නමුත් තම සහෝදරයන් සෝදිසි කරලා බලන්නට යෝසෙප්ට අවශ්‍ය
වුණා. මේ වෙනුවෙන් බෙන්ජමින්ගේ බෑගයේ සිල්වර් කෝප්පයක් දැමුවා.
මෙයින් බෙන්ජමින්ව වරදකට පටලවන්න උත්සහ කළා.
යෝසප් සිතූ ආකාරයෙන්ම බෙන්ජමින්ව ඒ වරදට හසුකර ගත්තා.
මේ නිසා යෝසෙප්ගේ සහෝදරයන් පැමිණ යෝසෙප් ඉදිරියේ වැඳ වැටී
තමුන්ගේ සහෝදරයා නිදහස් කරන මෙන් ඉල්ලා සිටියා.
මන්ද යාකොබ්ට තවත් දරුවෙක් නැතිවෙන එකට ඔවුන් කැමති වුණේ නෑ.

සහෝදරයෝ අයියෝ අපිට සමාවෙන්න. අපේ පියාණන්ට තවත් පුතෙක් නැති
වුණොත් ඒ දුකෙන් එයාව එළියට ගන්න එක පහසු දෙයක් වන්නේ නෑ.
අනේ ඒ නිසා අපිට සමාවෙන්න.

පොතේ ගුරා තමුන්ගේ බාල සහෝදර බෙන්ජමින් ගැනත් පියාණන˜ ගැනත් තමුන්ගේ
සහෝදරයන්ට ඇති අනුකම්පාවේ හදවත යෝසෙප් දැක්කා.

.......................................................................................



93Page

පොතේ ගුරා තව දුරටත් යෝසෙපට් තමාව පාලනය කරගන්නට නොහැකිව තදින්
හඬා වැළපී ඔවුන් බදාගත්තා. යොසෙප් ඔවුන්ට සමාව දුන්නා.

යෝසෙප් මම නුඹලාගේ සහෝදරයා යෝසෙප්...

සහෝදරයෝ මොකක්ද !!! ඔයා යොසෙප් ද?

පොතේ ගුරා යෝසෙප් මැරුණු බව ඔවුන් සිතාගෙන සිටි නිසා, යෝසෙප්ගේ
සහෝදරයන් යෝසෙප් ව හඳුනගත් ගමන්ම විශ්මයට පත් වුණා.
ඒ වගේම සහෝදරයන් සියලු දෙනාම යෝසෙප් නම් අග්‍රාමාත්‍යවරයා
ඉදිරියේ බය වෙලා හිටියා. නමුත් මේවන විටත් යෝසෙප් ඔහුගේ
සහෝදරයන්ට සමාව දී ප්‍රීතිමත්ව සිටියා.

යෝසෙප් මගේ සහෝදරයනි දුක් වෙන්න එපා. පියාණන්ව මෙහි ගෙනෙන්න.
අපි ඔක්කොම දැන් එකට ජීවත් වෙමු. යෝසෙප් හැමෝටම සමාව
දුන්නා.

පොතේ ගුරා ඉතාමත්ම ප්‍රීතියෙන් තමුන්ගේ පියාණන් සහ සහෝදරයන් සමඟ
ඊජිප්තුවේ ඔවුන් ජීවත් වුණා.

**ජීවිතයට අදාල කිරීම**

දුවේ පුතේ අපිට නරක කරන, නපුරු දේවල් කරන අයට අපි නරකක්, නපුරක් නොකරමු. පළි නොගනිමු. එකට එක නොකරමු.
නමුත් දවසක දෙවියන්වහන්සේ ඔවුන් අපි ළගට ගෙනෙනවා ඇත. එදාටත් අපි ඔවුන්ව ආදරයෙන් පිළි ගනිමු. ඔවුන්ට සමාව දෙමු.